# මැජික් පින්සලේ කතාව

අනුවර්තනය:  හාන් ෂිං

චිත්‍ර:  ලී ෂ–ජී

සිංහල අනුවාදය:  පෙයිචිං විදේශ භාෂායතනයේ සිංහල අංශයේ  ලින් හයි

DOLPHIN BOOKS  BEIJING

පළමුවැනි සිංහල මුද්‍රණය 1992

චීන මහජන සමූහාණ්ඩුවේ මුද්‍රිතයි

එකමත් එක කාලෙක මා ලයං ක්යලා ළමයෙක් උන්නා. පොඩිකාලෙම දෙමව්පියො නැති වෙච්ච හින්ද එයා ඒ කාලෙ ඉඳලාම ජීවත් වුණෙ දර කපලා තණකොල කපලා විකුණනවා වගේ වැඩ කරලායි. පුංචි වුණාට එයා චිත්‍ර අඳින්න හරි ආසයි. නමුත් එයාට පින්සලක් ගන්න පුළුවන් කමක් තිබුණෙ නැහැ.

දවසක් මා ල්‍යං ගමේ ඉස්කෝලෙ දෙරටුව ලඟින් ගමනක් යන කොට චිත්‍ර ගුරුවරයා ගමේ පොහොසතෙකුට දෙන්න චිත්‍ර වගයක් ඇඳ ඇඳ ඉන්නවා දැක්කා.

ඒක දැකලා එයා දන්නෙ නැතුවම වගේ ඉස්කෝලෙ ඇතුළට ගියා. එයා ගුරුවරයාට මෙහෙම කිව්වා: ''මමත් හරි ආසයි චිත්‍ර අඳින්න ඉගෙනගන්න. පොඩ්ඩකට මට පින්සලක් දෙන්න පුළුවන් ද?'' චිත්‍ර ගුරුවරයා එයාගේ දිහාව රවලා බැලුවා. එතකොට අර පොහොසතා කිව්වා: ''දුප්පත් කොල්ලෙක් කොහොම ද චිත්‍ර අඳින්නෙ? උඹට පිස්සු ද?'' ඒ දෙන්නා ලමයා ඉස්කෝලෙන් පන්නලා දැම්මා.

ඒ වුණාට මා ලියං තමන්ගෙ අදහස අත් ඇරියෙ නැහැ. ''මම දුප්පත් ලමයෙක් තමයි. ඒ වුණාට මට චිත්‍ර අඳින්න ඉගනගන්න බැරි මොක ද?'' මා ලියං මෙහෙම කල්පනා කෙරුවා.



එද ඉඳලා මා ල්‍යං චිත්‍ර අදින්න ඉගනගන්න අධිෂ්ඨාන කරගත්තා. එයා දිනපතා ම පුහුණු වුණා. දර කපන්න කඳුකරයට ගියාම එයා ගහකින් අත්තක් කඩාගන කුරුල්ලො පියාඹන හැටි බිම අදින්න මහන්සි ගත්තා.



ගහ ළහට ගිහිල්ලා තණකොළ කපන වෙලාවල එයා ඇහිල්ලක් වතුරෙන් තෙමාගන, ගහේ මාලුවො පීනන හැටි ගල් පොත්තක ඇන්ද.

රෑ ගෙදර ආවාට පස්සෙ එයා අහුරු කැල්ලක් අරගන, දවාලෙ ඇඳපු හැම චිත්‍රයක් ම ගුහාවෙ බිත්තියෙ ආයිත් වරක් අඳිනවා. පින්සලක් නැහැ කියලා එයාගේ උනන්දුව අඩු වුණෙ නැහැ.

මේ විදියට අවුරුද්දෙන් අවුරුද්ද ගත වුණා. දවසක් නැර චිත්‍ර ඇන්ද නිසා එයා පදිංචි වෙලා උන්න ගුහාවෙ බිත්ති හතර චිත්‍රවලින් පිරිලා තිබුණා.





මා ල්‍යාං ඉතාම ඉක්මනින් දියුණු වුණා. දැන් එයා අදින සතුන්ගෙ චිත්‍ර පණ ඇති සත්තු වගේමයි. දවසක් එයා ගල් පරයක් උඩ චූටි කිකිළියක් ඇන්දම ගිජු ලිහිණියො අහසින් පහත් වෙලා ඒක වටේ කරකැවෙන්න පටන් ගත්තා.



තව දවසක් එයා ගල් පර්වතයක බැවුමේ අලු පාට ලොකු වෘකයෙක් ඇන්ද. එතකොට තණකොළ කකා උන්න එළුවො, හරක්, බය වෙලා එතනින් පැනලා ගියා. ''අනේ, මට පින්සලක් ඇත්නම් කොච්චර හොඳ ද්'' කියල එයා කල්පනා කෙරුවා.



වරක් එයා මුළු දවසෙම වැඩ කරලා, චිත්‍ර ඇඳලා, ගෙදර ඇවිත් තෙහෙට්ටුව හින්ද ඇඳේ හාන්සි වුණා. එයාට එක් පාරටම නින්ද ගියා.

හදිසියෙම ගුහාව පාට පාට එළිවලින් දිස්න ගහන්න පටන් ගත්තා. එතකොට සුදු රැවුල තියන සීයා කෙනෙක් ඇවිල්ලා මෙහෙම කිව්වා: ‘‘මෙන්න මේක මැජික් පින්සලක්. මේක සැලකිල්ලෙන් පාවිච්චි කරන්න. මේකෙන් පුදුම දේවල් කරන්න පුළුවන්.’’ මා ලියං පින්සලේ අතට අරගන සීයාට ඉස්තුති කෙරුවා. ඒ පින්සල හරි ලස්සණයි. ඒක ටිකක් බරයි. ඒ වගේම ඒකෙ මිටෙන් රැස් විහිදුණා. ඒ මිට රත්තරන්වලින් හදපු එකක්.

මා ල්‍යං කලබල වෙලා අවදි වුණා. ඒ දැක්කෙ හීනයක්ය කියලා එයා හිතුවා. ඒ වුණාට මේ පින්සල ආවෙ කොහෙන් ද? ඒක නිකම්ම හීනයක් වෙන්න බැහැ.



එයා ඒ පින්සලෙන් අඳින්න පටන් ගත්තා. ඉස්සෙල්ලාම එයා කුරුල්ලෙක් ඇන්ද. එතකොට ඒ කුරුල්ලා අත්තටු ගහලා, අහසට නැගලා, ලස්සණට සින්දු කියන්න පටන් ගත්තා. මා ල්‍යංට හරි සන්තෝ-ෂයි: ''පුදුම මැජික් පින්සලක්!''

එයා යන යන හැම තැනටම මැජික් පින්සලේ අරගන ගියා. එයා ගමේ දුප්පත් ගොවි ගෙදරවලට ගිහිල්ලා එක එක විදියෙ· චිත්‍ර ඇඳලා දෙනවා. නගුලක් නැති ගෙදරක නගුලක් අඳිනවා. උදැල්ලක් නැති ගෙදරක උදැල්ලක් අඳිනවා. හරකෙක් නැති ගෙදරක හරකෙක් අඳිනවා.

වැඩි දවසක් ගත වුණෙ නැහැ. අල්ලපු ගමේ පොහොසත් ඉඩම්කාරයාට මැජික් පින්සලේ ගැන ආරංචි වුණා. එයා මා ලྻං අල්ලගන එන්න කියලා මිනිස්සු දෙන්නෙක් යැව්වා.

මා ලයං ආවාම එයා කිව්වා, එයාට රත්තරන් පොලු ඇඳලා දෙන්න කියලා. තණ්හාව වැඩි කාටත් රත්තරන් පොලු ඕන. මා ලයංට ඉඩම්කාරයා පේන්න බැහැ. එයා කිව්වා ''මට බැහැ'' කියලා. ඉඩම්කාරයා ඒකට තරහ වෙලා, මා ලයං කාමරේක දලා, කන්න බොන්න දෙන්නෙ නැතුව, හිර කරලා තිව්වා.

එද රෑ හිම වැස්සා. දූන් පොළොව හොඳටම හිමවලින් වැහිලා. මා ලයංට හරිම සීතලයි, බඩගිනියි. ඒ ගෙයිම ගොවියො කීප දෙනෙක් හිර කරලා උන්නා. මා ලයං ලොකු ලිපකුත් රොටි ටිකකුත් ඇන්ද. එයා ඒ රොටි ටික ලිපේ ගින්දරට අල්ලලා, කර කරලා, අනිත් අය එක්ක එකතු වෙලා කෑවා. එතකොට කාගෙත් බඩ පිරුණා.

ඊට පස්සෙ මා ලාං බිත්තියෙ මුදුනට නගින්න පුළුවන් විදියට ඉනි මගක් ඇන්ද. ''දැන් හුඟක් රෑ වෙලා, දැන් අපට පැනලා යන්න පුළුවනි.'' ඉස්සෙල්ලාම මා ලාං ඉනිමග දිගේ උඩට නැග්ගා. අනිත් කවුරුත් ඊළඟට නැග්ගා. මේ විදියට කවුරුත් ඉක්මනටම පිටවෙලා පැනලා ගියා.

පිට වෙලා ආවාට පස්සෙ මා ලාං අශ්වයෙකුයි පන්දමකුයි ඇන්ද. ඒ පාර එයා අශ්වයා පිට නැගලා පන්දම අතට අරගන, පාර දිගේ යන්න පිටත් වුණා. මා ලාං පැනලා ගිය එක ඉඩම්කාරයාට ආරංචි වුණා. ඉඩම්කාරයා එයා අල්ලගන එන්න මිනිස්සු යැව්වා. ඒ වුණාට මා ලාංගේ අශ්වයා තරම් වේගයෙන් දුවන්න ඒ ගොල්ලන්ගෙ අශ්වයන්ට පුළුවන් කමක් තිබුණෙ නැහැ.

මා ලියං අශ්වයා පිට නැගිලා නවතින්නෙ නැතුව දවස් ගණනක්ම ඇවිද්දා. අන්තිමට එයා පුංචි ගමකට ගියා. එයාට කරන්න වැඩක් එහේ තිබුණෙ නැහැ. ඒ වුණාට, එයා ගමේ මිනිස්සුන්ට ලස්සණ චිත්‍ර ඇඳලා දුන්නා.

වසන්ත කාලෙ දවසක් සීයා කෙනෙකුයි පුංචි ලමයෙකුයි බොහොම අමාරුවෙන් කුඹුරක් හානවා. මා ලියංට කණගාටු හිතිලා මැජික් පින්සල අතට අරගන චිත්‍රයක් ඇන්ද. ඇඳලා ඉවර වුණාම, ලොකු හරකෙක් කුඹුරට දුවලා ගිහිල්ලා නගුල අදින්න පටන් ගත්තා.

තව දවසක් කුඹුරක ගොයම් මැළවිලා තියනවා මා ල්‍යං දැක්කා. ඒක දැකලා එයා දිය රෝදෙකුයි ඇළකුයි ඇන්ද. ඒ දිය රෝදෙ කරකැවෙන කොට, වතුර ''හෝ හෝ'' ගාලා කුඹුරට ගලන්න පටන් ගත්තා.

මැජික් පින්සලේ කතාව ඒ නුවර පුරාම පැතිරෙන්න පටන් ගත්තා. ඒ විදියට ඒක මුදලිට ආරංචි වුණා. එයා මා ල්‍යං අල්ලගන එන්න කියලා එක පාරට ම මිනිස්සු යැව්වා.

ඒ ගොල්ලො මා ල්‍යං අල්ලගන මුදලිගෙ වලව්වට ගෙනාවා. ‘‘මෙහාට වරෙන්’’ කියලා මුදලි මා ල්‍යංට අඬ ගැහුවා. ළඟට ආවාම මුදලි මැජික් පින්සල උදුර ගත්තා. උදුරගන වලව්වෙ චිත්‍රකාරයා ගෙන්නුවා.

ඒ චිත්‍රකාරයා මුදලි ළඟ දණ ගහලා මෙහෙම ඇහුවා: ‘‘හාමුදුරුවනේ, මොකක් ද අඳින්න තියෙන්නෙ ?’’ එතකොට ‘‘මට රත්තරන් පර්වතයක් ඇඳලා දියන්’’ කියලා මුදලි කිව්වා.

චිත්‍රකාරයා මැජික් පින්සල අරගන එක රත්තරන් පර්වතයක් ඉස්සෙල්ලා ඇන්ද. ඒ වුණාට තණ්හාකාර මුදලිට එක රත්තරන් පර්වතයක් මදි. ඒ නිසා චිත්‍රකාරයා තව තව රත්තරන් පර්වත ඇන්ද. එයා ඇඳපු චිත්‍ර කඳු වැටියක් වගෙයි. ඇඳලා ඉවර වුණාට පස්සෙ, ඒ රත්තරන් කඳු වැටියට මොකද වුණෙ? ඒවා නිකම් ගල් පරුවත ගොඩක් වුණා.

මැජික් පින්සල තිබුණයි කියලා, මා ලියං ඇර වෙන කාටවත් රත්තරන් කඳු අඳින්න බැරිය කියන එක මුදලිට තේරුණා. ඒ නිසා එයාආයෙත් මා ලියං ගෙන්නුවා. ගෙන්නලා, මා ලියංගෙ හිත දිනා ගන්න හිතාගන එයාගෙ ගුණ කියන්න පටන් ගත්තා. ''ඔයා හොඳ ලමයෙක්. ඒ වගේම ඔයා අපූරු දක්ෂයෙක්. මට රත්තරන් ගහක් ඇඳලා දෙන්න බැරි ද?'' මැජික් පින්සල ආපහු කොහොම හරි ගන්න හිතාගන මා ලියං ඒකට කැමතිවා වගේ පෙන්නුවා. මුදලිට හරි ඉහළයි. එයා පින්සල ආපහු මා ලියංට දුන්නා.

මා ලාංං හොඳ වැඩපිළිවෙළක් හිතින් හිතාගන, කිසිම කතාවක් නැතුව මැජික් පින්සල අතට ගත්තා. වැඩි වෙලාවක් ගියෙ නැහැ. අගක් මුලක් නැති හරි ගැඹුරු නිල් පාට මහමූදක් මුදලිට පෙනුණා. එයාට හරියට තරහ ගිහිල්ලා මා ලාංංට බැන්නා. ''මම කිව්වෙ රත්තරන් ගහක් අඳින්න කියලයි! මහමූදක් අඳින්න නෙවෙයි.''

ඒ පාර මා ලාංං මූද මැද දූපතකුයි ඒක ඇතුළෙ ඉතාම උස ගහකුයි ඇඳලා මෙහෙම කිව්වා. ''ඔබ කියාපු රත්තරන් ගහ මේක නෙවෙයි ද?''

රත්තරන් පාට රැස් විහිදෙන ඒ ගහ දැකලා, මුදලි කිව්වා. ''ඉක්මන් කරලා ඔරුවක් අඳින්න. ඒ ගහ හොලවලා රත්තරන් කාසි ගේන්න මම එතනට යන්න ඕන'' කියලා.

මා ලාං ලොකු නැවක් ඇන්ද. මුදලියි එයාගෙ මැණිකෙයි දුවයි තව නිලධාරිවරුයි ඒකට නැංගා.

ඊළඟට මා ල,යං හුළඟක් ඇන්ද. එතකොට මූදෙ රළ ගහන්න පටන් ගත්තා. නැව පිටත් වුණා.

නැව යන්නෙ හෙමින්ය කියලා හිතලා, මුදලි කෑ ගහලා මෙහෙම කිව්වා: ''හුළඟ හුහක් තදින් හැමුවොත් හොඳයි.''



මා ලයං පින්සලෙන් ගන ඉරි ටිකක් ඇන්ද. එතකොට හුළඟ තදට හමන්න පටන් ගත්තා. ඒ පාර මූදෙ කුණාටුවක් ඇති වුණා. නැව ඒ පැත්තට මේ පැත්තට ගැස්සෙන්න පටන් ගත්තා. මුදලි බය වෙලා හයියෙන් කෑ ගැහුවා. ''හුළඟ ඔය ඇති! හුළඟ ඔය ඇති!''



ඒ හඬ නැහුණ වගේ, මා ලයං දිගටම හුළඟ ඇදගන ගියා. මූදෙ රළ නැවේ තදින් හැප්පෙන්න පටන් ගත්තා. යෝද රළ ගෙඩි නැව් තට්ටුවට කඩන් වැටුණා. අන්තිමේදි නැව පෙරළිලා කෑලිවලට කැඩුණා. මූදලි ඇතුළු හැම දෙනාම ගිලිලා මූදෙ පතුලට වැටුණා.

ඊට පස්සෙ, මා ලයං ආපහු මුල් ගමට ගියා. ගමේ මිනිස්සුන්ට මා ලයං දකලා හරි සන්තෝසයි. එයා ඉස්සර වගේම දර, තණකොළ කපලා විකුණ විකුණ, චිත්‍ර ඇඳ ඇඳ, සතුටින් ජීවත් වුණා.